**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 සැප්තැම්බර් / ඔක්තෝබර්**

**සමාජීය විද්‍යා පීඨය**

# ජනසන්නිවේදනය

## සන්නිවේදන මූලධර්ම - MACO 18214

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණ කොට ගෙන දෙපාර්ශවයක් අතර එක හා සමාන මානසික තත්ත්වයක් ඇති කිරීම සන්නිවේදනය යි." මෙම ප්‍රකාශය සන්නිවේදන නිර්වචන 03ක් වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. "සන්නිවේදන වර්ගීකරණයේ දී පුද්ගලාන්තර සන්නිවේදනය සුවිශේෂී වේ." මූලික සන්නිවේදන වර්ග 04 ක් දක්වා, උක්ත ප්‍රකාශය පහදන්න. (ලකුණු 20)

03. සන්නිවේදන ක්‍රියාවලියේ තිබෙන ප්‍රධාන මූලිකාංග දක්වා, ඉන් තෝරා ගන්නා ලද මූලිකාංග 04ක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 20)

04. "සන්නිවේදන ක්‍රියාවලියේ දී වාචික සන්නිවේදනය වඩාත් ඵලදායීව සිදුකිරීම සඳහා නිර්වාචික සන්නිවේදනය අත්‍යාවශ්‍ය ය." තෝරාගත් සමාජ- සංස්කෘතික සන්නිවේදන අවස්ථා කිහිපයක් ඇසුරෙන් මෙය විස්තර කරන්න. (ලකුණු 20)

05. අධිපතිවාදී සන්නිවේදන සංකල්පය වඩාත් ප්‍රභල ය. මූලින සන්නිවේදන සංකල්ප 04ක් වත් ඇසුරෙන් උක්ත ප්‍රකාශය සංසන්දනාත්මකව විමසුමක් කරන්න. (ලකුණු 20)

06. "භාවිත හා සංතෘප්ත න්‍යාය (Uses and Gratifications Theory) මාධ්‍ය පරිභෝජනය හඳුනා ගැනීමෙහි ලා වඩාත් විද්‍යාත්මක ය." නූතන මාධ්‍ය පරිභෝජනයට අදාළ සංසිද්ධීන් ඇසුරෙන් සාකච්ඡාවක් කරන්න. (ලකුණු 20)

07. "මාධ්‍ය සාක්ෂරතාව සහ මාධ්‍ය සංස්කෘතිය අතර ඇති සබඳතාව නූතන ඩිජිටල් සමාජ ජාලා මාධ්‍ය බලපෑම හඳුනා ගැනීමට උපකාරී වේ." විචාරයක් කරන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතරින් **හතරක් (04)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i. අලංකාරවාදී සන්නිවේදන ප්‍රවේශය
    ii. මාධ්‍ය බලපෑම
    iii. අතර්‍ය සන්නිවේදනය
    iv. සමාජවාදී සන්නිවේදන සංකල්පය
    v. මාධ්‍ය රෝපණ න්‍යාය
    vi. කණ්ඩායම් සන්නිවේදනය

(ලකුණු 05x4=20)

*****************************